2025-12-26

**මාධ්‍ය නිවේදනයයි**

**ඡන්දහිමියන් ගණන් ගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට දේශපාලන පක්ෂ නියෝජිතයින් නම් කිරීම.**

1. 2026 වර්ෂයට අදාල ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු 2026 පෙබරවාරි 01 වන දින සිට ආරම්භ වීමට නියමිතය.

2. පෙර වර්ෂ වල මෙන්ම මෙවරද ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගැනීමේ නිලධාරීන් සෑම ගෘහයකටම යාම සිදුනොකරන අතර "අ" සහ "ආ" ලැයිස්තු (අලුතින් ඇතුළත් වන සහ ඉවත් වන නම් ලැයිස්තු) යාවත්කාලීන කිරීම සඳහා පමණක් අදාල ගෘහයන් වෙත පැමිණෙනු ඇත.

3. ඒ අනුව ඡන්ද හිමියන් ගණන් ගැනීමට අදාල තොරතුරු ලබාගන්නා ගෘහයන් වෙත පමණක් ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු කරනු ලබන ආකාරය නිරීක්ෂණය කිරීමේ අවස්ථාව සහ ගණන් ගැනීමේ නිලධාරීන් විසින් අදාල තොරතුරු එකතු කර අවසන් වූ පසු ඔවුන් ඉදිරිපිටදී ගණන් ගැනීමේ නිලධාරීන්ගේ නිර්දේශය **(ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා සුදුසු නුසුදුසු බව)** නිරීක්ෂණය කළ හැක. මෙම නිරීක්ෂණයේදී පහත සඳහන් ආකාරයන් හෙළි වුවහොත් ඒ පිළිබඳව ගණන් ගන්නා නිලධාරියාට ලිඛිතව දැනුම් දීමටත් එම දැනුම් දීමේ ලිපියේ පිටපත අදාල දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරයා වෙත නොපමාව යොමු කිරීමටත් හැකියාව පවතී.

   එම අවස්ථා නම්,

   1. **සාමාන්‍ය පදිංචියක් සහිත යම් කිසි ගෘහයකට අදාල පුරවැසියන්ගේ නම් ඡන්දහිමියන් වශයෙන් ගණන් ගැනීම සිදු නොකිරීම.**
   2. **සුදුසුකම් සහිත තැනැත්තන්ගේ නම් ගණන් ගැනීම නැතහොත් "සුදුසු" ලෙස නිර්දේශ නොකිරීම.**
   3. **දැනටමත් වයස අවුරුදු 18 කට අඩු තැනැත්තන් ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති අවස්ථා (තිබේනම්) හෝ 2026 වර්ෂයට නිර්දේශ කර ඇති අවස්ථා (පරිපූරක නාම ලේඛන සඳහා අදාල නොවේ.)**
   4. **සාමාන්‍ය පදිංචියක් නොමැති තැනැත්තන් යම් ලිපිනයක් යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලා සිටින අවස්ථා හා එවැනි නම් "සුදුසු" ලෙස නිර්දේශ කර තිබීම.**
   5. **එක් ලිපිනයකට වඩා වැඩි සංඛ්‍යාවක් යටතේ ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි වීමට ඉල්ලා ඇති තැනැත්තන්,**
   6. **ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා වෙනත් කුමන ආකාරයක හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කරනු ලබන අවස්ථා තිබේනම් හෝ නුසුදුසු පුද්ගලයන් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වී තිබීම.**


මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අපට ඇති දීර්ඝ කාලීන අත්දැකීම් වනුයේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමට දේශපාලන පක්ෂ වලට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් නියෝජිතයින් පත් කිරීමට හැකියාව තිබුනද දේශපාලන පක්ෂ සුළු ප්‍රමාණයක් හැරුනුකොට අති බහුතරයක් දේශපාලන පක්ෂ එලෙස තම නියෝජිතයින් පත් නොකරන බවය. ඡන්දයක් ආසන්නයේ තම පාක්ෂිකයන්ගේ නම් ඇතුලත් වී නොමැති බවට මැසිවිලි නැගීමෙන් පලක් නොවන බව අවධාරණය කරන අප, දේශපාලන පක්ෂ නියෝජිතයින් මෙම ක්‍රියාවලියට සක්‍රිය ලෙස සම්බන්ධ වන්නේ නම් සුදුසුකම් ලත් සියල්ලන් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුලත් කර ගැනීම සහ එම ලේඛනයට සුදුසුකම් රහිත හෝ නුසුදුසුකම් වලට යටත් වූ පුද්ගලයින්ගේ නම් ඇතුලත් වීමේ හැකියාව වළක්වා ගත හැකි බව අප අවධාරණය කරමු.


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංගයක් වන ඡන්දය ප්‍රකාශ කිරීමට නම් ඡන්ද හිමි නාමලේඛනයේ නම පවත්වා ගැනීම අතවශ්‍ය කරුණකි. එනයින් බලන කළ ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුලත් කර ගැනීමේ කටයුත්තේ ප්‍රමුඛ කාර්යභාරයක් ග්‍රාම නිලධාරීන්ට පැවරුනද දේශපාලන පක්ෂ වලටද අත්නොහළ හැකි වගකීමක් පැවරී ඇත. ඒ අනුව මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අප සියලු දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනුයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා ග්‍රාම නිලධාරී මට්ටමින් සකස් කරන ලද දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ නාම ලේඛනය 2026.01.24 දිනය පෙර අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිවරුන් වෙත බාරදීමට කටයුතු කරන ලෙසය.



රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ